කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : 04 WW/TC/21/05/22/04

වර්ණය : ඇම්බර්

# ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව වර්ධනය වී ඇති අඩු පීඩන තත්ත්වය පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2021 මැයි මස 22 වන දින ප.ව. 03.00 ට නිකුත් කරන ලදී.

## දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

## සැලකිලිමත් වන්න!

- දැනට ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශයේ පවතින අඩු පීඩන තත්ත්වය මැයි 23 වන දින වන විට පීඩන අවපාතයක් දක්වාත් මැයි 24 වන විට සුළි කුණාටුවක් දක්වා වර්ධනය වීමේ වැඩි හැකියාවක් පවතී. මෙම පද්ධතිය වයඹ දිශාවට ගමන් කර මැයි 26 වන දින වනවිට බටහිර බෙංගාල වෙරළ වෙත ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.

- එබැවින්, ඉදිරි දින කිහිපයේ දී, උතුරු අන්දමන් සහ ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශය, නිරිත දිග බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශ වල ගිගුරුම් සහිත වැසි සමග විටින් විට වැඩිවන තද සුළං ( පැ.කි.මී. 50-60 සහ විටින් විට පැ.කි.මී. 70-80 දක්වා වන තද ප්‍රහාරාත්මක සුළං) හේතුවෙන් රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ අපේක්ෂා කළ හැක.

- ඉහත පද්ධතියේ බලපෑම හේතුවෙන්, ඉදිරි දින කිහිපයේදී දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 50-60 දක්වා පමණ) ඉහළ යන බැවින් එම මුහුදු ප්‍රදේශය විටින් විට රළු වේ.



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- මැයි 22 දින සිට නැවත දැනුම් දෙන තුරු, ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශය තුල (08N-20N, 83E-100E) සහ මැයි මස 23 දින සිට නැවත දැනුම් දෙන තුරු, දිවයින වටා වන මුහුදු ප්‍රදේශය තුල ධීවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.
- දැනට මෙම මුහුදු ප්‍රදේශවල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස හැකි ඉක්මනින් ගොඩබිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.
- ධීවර හා නාවුක ප්‍රජාව මේ සම්බන්දයෙන් නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.